**චක්‍රලේඛ අංක : 7/96 (II)**

මගේ අංකය:
සමුපකාර සේවක කොමිෂන් සභාව,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1998.08.17

බස්නාහිර පළාතේ සියළුම සමුපකාර සමිති
සභාපතිවරුන් වෙත,

**විනය පරීක්ෂණ නිලධාරීන් පත්කිරීම**

1996.11.12 දිනැති අංක 7/96 හා 1997.11.03 දිනැති අංක 7/96 (I) දරණ බස්නාහිර පළාතේ සමුපකාර සේවක කොමිෂන් සභා චක්‍රලේඛ හා බැඳේ.

ඒ අනුව පත් කරනු ලැබූ විනය පරීක්ෂණ නිලධාරීන් ගේ ලැයිස්තුව සංශෝධනය කිරීමට කොමිෂන් සභාවේ අවධානය යොමු වී ඇති බැවින්, පහත සඳහන් විස්තර නොපමාව මෙම කොමිෂන් සභාවට ලැබෙන්නට සලස්වන මෙන් නියමය පරිදි දන්වමි.

1. ඔබ විවිධ සේවා සමුපකාර සමිති බල ප්‍රදේශ තුල හෝ ඊට ආසන්නව පිහිටි රාජ්‍ය ආයතනයන්හි සේවය කරන සමුපකාර සමිතිවල විනය පරීක්ෂණ භාරගැනීමට කැමති මාණ්ඩලික නිලධාරීන් ගේ නාම ලේඛනයක්. (ලිපිනය සහ තනතුරු ආදි තොරතුරු ද ඇතුලත් ව)

2. ඔබ විවිධ සේවා සමුපකාර සමිති බල ප්‍රදේශය තුල හෝ ඊට ආසන්න ප්‍රදේශයක පදිංචි විනය පරීක්ෂණ භාර ගැනීමට කැමැති සමුපකාර දෙපාර්තමේන්තුවේ සේවය කළ විශ්‍රාමික මාණ්ඩලික නිලධාරීන් ගේ නාම ලේඛණයක්. (සමුපකාර දිස්ත්‍රික් නිලධාරි මට්ටමට වඩා අඩු මට්ටමක සේවය කර විශ්‍රාම ගිය නිලධාරීන් ඇතුලත් නොකරන්න.)

මෙසේ පත්කරනු ලබන විනය පරීක්ෂණ නිලධාරීන් මාස තුනක් ඇතුලත තමන් භාරගත් විනය පරීක්ෂණ කටයුතු නිම කිරීමටත්, මොනම අවස්ථාවකදී වත් රැකවරණ නිලධාරීන් වශයෙන් පෙනී නොසිටින බවටත් කොමිෂන් සභාව සමග එකඟ විය යුතු බව ද වැඩිදුරටත් දන්වමි.

කේ. එස්. විමලවීර
ලේකම්
සමුපකාර සේවක කොමිෂන් සභාව
බස්නාහිර පළාත.

පිටපත්:-
1. ලේකම්, සෞඛ්‍ය, සමුපකාර හා වනිතා කටයුතු අමාත්‍යාංශය (බ.ප.) - දැ.පි.
2. ලේකම්, සමුපකාර සේවක කොමිෂම - දැ.පි.
3. සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් (බ.ප.) - දැ.පි.
4. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්, කළුතර/ගම්පහ/කොළඹ - දැ.පි.
5. සියළුම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරුන්
7. සමස්ත ලංකා සමුපකාර සේවක සංගමය
8. ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය.